ලේකම් / செயலாளர் / Secretary
දුරකථනය / தொலைபேசி / Telephone } 2449959
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. } 2445447
E-Mail: secretary@moj.gov.lk

ප්‍රධාන කාර්යාලය / பொது அலுவலகம் / General Office
දුරකථනය / தொலைபேசி / Telephone } 2323022
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. } 2320785
Web Site: www.moj.gov.lk

# අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
# நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு
# Ministry of Justice, Prison Affairs and Constitutional Reforms

තැ.පෙ. / தபால்பெட்டி / P.O. Box. } 555
ඉලෙක්ට්‍රෝනික තැපැල / மின்அஞ்சல் / E-mail } info@moj.gov.lk
නො 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10
இல 19, ஸ்ரீ சங்கராஜ மாவத்த, கொழும்பு 10
No 19, Sri Sangaraja Mw, Colombo 10

මගේ අංකය / எனது இல / My No. } MOJ/E16/2/2(10)/20223

ඔබේ අංකය / உமது. இல. / Your No. }

දිනය / திகதி / Date } 2023.06 .

මහාධිකරණ විනිසුරුවරුන්,
සිවිල් අභියාචනාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්,
දිසා විනිසුරු/මහේස්ත්‍රාත්වරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
කම්කරු විනිශ්චයාධිකාර සභාපති/අතිරේක මහේස්ත්‍රාත්වරුන්,

**අධිකරණ විනිසුරුවරුන් සඳහා වන සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය - 20223/2024**

සියළුම අධිකරණ විනිසුරුවන් සඳහා 2023.06.17 දින සිට 2024.06.16 දින දක්වා බාහිර සෞඛ්‍ය ප්‍රතිකාර වෙනුවෙන් රුපියල් 35,000.00 උපරිමයකට යටත්ව රුපියල් 500,000.00 ක වටිනාකමින් යුත් සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය මෙම වසරේ **ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් විසින් ආවරණය කරනු ලබයි.** ඒ සඳහා දායක වීමට කැමැත්තේ නම් මේ සමඟ අමුණා ඇති ඇමුණුම් 01 ආකෘති පත්‍රයේ සියලු කරුණු සම්පූර්ණ කර 2023.06.23 දිනට පෙර ලේකම්, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව දන්වමි.

02. එසේම විනිසුරුවරුන් විසින් ඇරිමට නියමිත මුදල, වාරික 04 කින් ජුනි,ජූලි,අගෝස්තු සහ සැප්තැම්බර් මාස වලදී පහත පරිදි ගෙවීමේ හැකියාව ඇත. ඔබගේ වැටුපෙන් අය කර ගන්නා දායක මුදල් අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 07/2022 පරිදි, **ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් නමට ලියූ චෙක්පත , ජාතික හැඳුනුම්පත් අංක ඇතුලත් කරන ලද ප්‍රේෂණ ලැයිස්තුවක් (Remittance List ) සමඟ ආවරණ ලිපියක් සහිතව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, S.H.E දෙපාර්තමේන්තුව,13 වන මහළ, නො: 21, වෝක්ෂෝල් වීදිය, කොළඹ 02 වෙත**, සියළුම කලාප මහාධිකරණයන්හි ගණකාධිකාරි / රෙජිස්ට්‍රාර් මගින් යොමු කිරීමට කටයුතු කරන ලෙස දන්වමි.(සෑම මසකටම අදාල මෙම ප්‍රේෂණ ලැයිස්තු වල සත්‍ය පිටපතක් බවට තහවුරු කරන ලද පිටපතක් ලේකම්, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙතද යොමු කළ යුතුය.)

| දායකත්වය | ගෙවිය යුතු මුදල (රු) | | | | |
|---|---|---|---|---|---|
| | විනිසුරුවරයා සඳහා පමණක් | විනිසුරු සහ කලත්‍රයා සඳහා පමණක් | විනිසුරු, කලත්‍රයා හා එක් දරුවකු සඳහා | විනිසුරු, කලත්‍රයා හා දරුවන් දෙදෙනෙකුට වැඩි ගණනක් සඳහා | විනිසුරුවරයා අවිවාහක නම් විනිසුරුවරයා හා දෙමව්පියන් සඳහා |
| රජයෙන් ගෙවිය යුතු මුදල - 75% (විනිසුරුවරයා වෙනුවෙන් පමණි) | 61,513.00 | 61,513.00 | 61,513.00 | 61,513.00 | 61,513.00 |
| රක්ෂිතයා විසින් දැරිය යුතු මුළු මුදල | 20,504.00 | 30801.00 | 37902.02 | 37902.02 | 37902.02 |
| 01වන වාරිකය | 5126.00 | 7700.25 | 9475.52 | 9475.52 | 9475.52 |
| 02වන වාරිකය | 5126.00 | 7700.25 | 9475.50 | 9475.50 | 9475.50 |
| 03වන වාරිකය | 5126.00 | 7700.25 | 9475.50 | 9475.50 | 9475.50 |
| 04වන වාරිකය | 5126.00 | 7700.25 | 9475.50 | 9475.50 | 9475.50 |

03. රක්ෂණ සඳහා ලියාපදිංචි වූ සෑම විනිසුරුවරයකුම පළමු වාරිකය 2023 ජූනි මස වැටුපෙන් රක්ෂණ ආයතනය වෙත යොමු කළ යුතු අතර ඉන්පසු සාමාජික කාඩ්පත නිකුත් කරනු ලැබේ.

04. ඔබට අවශ්‍ය වැඩි විස්තර දැනගැනීම සඳහා පහත දක්වා ඇති දුරකථන අංක හා සම්බන්ධ විය හැක.

071-4096825 - එච්.එම්.පී බණ්ඩාර මහතා, රක්ෂණ උපදේශක.
077-2296574 - නාලක උදය කුමාර මහතා, කළමණාකරු( අලෙවි )
077 -3423825 - දිල්ෂානි ඩෙෆ් මහත්මිය, කලමණාකරු (හිමිකම් හා ප්‍රතිලාභ)

05.මෙම තොරතුරු වලට අමතරව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනයට අදාල ප්‍රතිලාභ/හිමිකම් හා ප්‍රතිලාභ/හිමිකම් ලබා ගැනීමේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් වූ තොරතුරු මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

ලේකම්,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

පිටපත් -: සියලුම කලාප මහාධිකරණ ගණකාධිකාරීවරුන්/රෙජිස්ට්‍රාර්වරුන් වෙත ( තම කලාප මහාධිකණය හරහා ගෙවීම් සිදුකරනු ලබන සියළු විනිසුරුවරුන් දැනුවත් කිරීම සහ ඉදිරි ගෙවීම් කටයුතු සඳහා.)